සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/SW/14/19/01/Circular | ඔබේ අංකය / உமது இல / Your No: .......... | දිනය / திகதி / Date: 2022.04.07 |

සියළුම දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
ප්‍රාදේශීය ලේකම්,
දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ/ දිස්ත්‍රික් සමෘද්ධි සහකාර අධ්‍යක්ෂ,
සමෘද්ධි කළමනාකරුවන්/ ප්‍රවර්ධන නිලධාරි / සමෘද්ධි සංවර්ධන නිලධාරින් වෙත.

**<u>ආර්ථික වශයෙන් ශක්තිමත් වූ ප්‍රතිලාභින් සහිත සමෘද්ධි සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම - 2022</u>**

ඉහත කරුණට අදාළව මාගේ සමාංක දරණ 2022.03.10 දිනැති උපදෙස් ලිපිය හා බැඳේ.

02. එහි පළමු ඡේදයේ අංක I සිට VI දක්වා හඳුන්වා ඇති කාණ්ඩවලට ඇතුලත් සමෘද්ධි සහනාධාරලාභී පවුල්වල මාසික සමෘද්ධි සහනාධාරය සංශෝධනය කිරීම ග්‍රාමීය කමිටු නිර්දේශ මත සිදුකල යුතු බව දන්වා ඇත. තවද එහි අනු අංක V යටතේ ආදායම් උත්පාදන මාර්ග වල යෙදවිය හැකි චංචල හා නිශ්චල දේපළ හිමි සාමාජිකයින් සිටින සමෘද්ධි සහනාධාරලාභී පවුල්ද සංශෝධනය කිරීමට උපදෙස් ලබා දී ඇත. එහෙත් එලෙස චංචල හෝ නිශ්චල දේපළකට හිමිකම් තිබූ පමණින් එම පවුල් සඳහා හිමිව තිබෙන සහනාධාරය සංශෝධනය කිරීම අවශ්‍ය නොවන අතර, එවැනි පවුල් සඳහා ග්‍රාමීය කමිටු මඟින් අදාළ නිර්දේශ ලබා දීමේදී පවුලේ ඇති වෙනත් ආදායම් මාර්ග ඇතුළු අනෙකුත් සාධක පිළිබඳව සැලකිල්ල යොමුකර තීරණ ගත යුතුය.

03. එමෙන්ම, ඉහත සඳහන් කර ඇති ලිපියෙහි 03 වන ඡේදය මෙයින් තවදුරටත් පැහැදිලි කරමි. පවුලේ සාමාජික සංඛ්‍යාව අනුව සහනාධාර වටිනාකම තීරණය කර ඇති බැවින්, සමෘද්ධි සහනාධාරය මුලින්ම ලබා ගැනීම සඳහා අදාළ කර ගත්තා වූ සාමාජිකයින් ඇතුලත් පවුල සමාජ ආරක්ෂණ "පවුල" ලෙස සැලකිය හැකිය. ඒ අනුව උපතකදී අදාළ සාමාජිකයා පවුල තුළට ඇතුලත් කරගත හැකි අතර, විවාහයකදී හෝ මරණයකදී අදාළ සාමාජිකයා පවුල තුළින් ඉවත් කල යුතුය.

04.පෙර සඳහන් කර ඇති ලිපියේ උපදෙස් වලට අනුව, මෙම ලිපිය මඟින් ලබා දී ඇති උපදෙස් වලට පටහැනි ලෙස යම් ක්‍රියා මාර්ගයක් මේ වන විටත් ගෙන ඇත්නම් එවැනි සිද්ධීන් සඳහාද මේ ලිපියේ උපදෙස් පරිදි ක්‍රියාමාර්ග ගන්නා ලෙස කාරුණිකව දැනුම් දෙමි.

05. ඉහත කරුණු හා ඊට අදාළව පෙර නිකුත් කරන ලද උපදෙස් කෙරෙහි අවධානය යොමුකර මෙම වසරේ වෙන්කර ඇති ප්‍රතිපාදන සැලකිල්ලට ගෙන සහනාධාර සංශෝධනය කිරීමේ කාර්යය සිදු කරන ලෙස වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත්:-**

01.ලේකම්, (සමෘද්ධි ගෘහආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, සවයංරැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය) - ඔබ විසින් ලබා දී ඇති උපදෙස් හා බැඳේ.
02. ප්‍රධාන ගණකාධිකාරි (සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව) - අ.ක.ස. හා කා.දැ.පි.
03. ප්‍රධාන අභ්‍යන්තර විගණක - අ.ක.ස.
04. සියළුම අංශ ප්‍රධානින් - අ.ක.ස..

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරි / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |